ශීර්ෂ 160 - පරිසර අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1. කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

2. කොටස - එක් එක් ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව.

## I කොටස

පරිසර අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

---

### 1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 283 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |

### 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

#### මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.3,474,186,458 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.2,651,537,957 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.751,216,899 ක් හා රු.71,431,601 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35.9 ක් හා සියයට 5.24 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 160 | 2,110,716,458 | 1,359,499,559 | 751,216,899 | 35.59 |
| 283 | 1,363,470,000 | 1,292,038,398 | 71,431,602 | 05.24 |
| **එකතුව** | **3,474,186,458** | **2,651,537,957** | **822,648,501** | **23.68** |

2.2 ආදායම් ගිණුම්

ඇස්තමේන්තුගත තථ්‍ය ආදායම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේදී ආදායම් සංකේත දෙකක් සඳහා එකතුව රු.1,210,000,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර ඉන් එකතුව රු.960,700,732 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 79 ක ආදායම් රැස්කර ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2013 දෙසැම්බර් 31 දිනට | | | අඩුවීම ඇස්තමේන්තු ගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඇස්තමේන්තු කළ ආදායමට වඩා එකතු කළ ආදායම අඩුවීම | |
| | රු. | රු. | රු. | |
| 1003:07:03 | 65,000,000 | 56,743,886 | 8,256,886 | 12.70 |
| 2002:01:02 | 1,145,000,000 | 903,956,846 | 241,043,154 | 21.05 |
| එකතුව | **1,210,000,000** | **960,700,732** | **249,300,040** | **20.60** |

2.3 අත්තිකාරම් ගිණුම්

2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවකට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂ | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 16001 | 7,500,000 | 6,389,875 | 5,600,000 | 8,470,429 | 45,000,000 | 24,982,212 |
| 28301 | 75,000,000 | 59,440,212 | 45,000,000 | 63,341,899 | 301,000,000 | 237,787,858 |

2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

2.4.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුමේ ශේෂය රු. 510,361ක් විය.

2.4.2 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 31,080,854 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| පරිසර අමාත්‍යාංශය | 6000/000/00/0015/0070 | 6,744,538 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 6000/000/00/0015/0138 | 24,336,316 |
| එකතුව | | 31,080,854 |

2 කොටස

-----------

**එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව**

**1. ශීර්ෂය 160 - පරිසර අමාත්‍යාංශය**

**1.1 විගණන විෂය පථය**

පරිසර අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 13 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත්කර ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පරිසර අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.4 සිට 1.11 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම**

වැය විෂයයන් 12 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයට උපයෝජනය කළ පසු ඉතිරියේ එකතුව රු.1,106,359 ක් වි තිබුණි. එම ඉතිරිය රු.8,353,122 කින් ඉක්මවා රු.9,457,481 ක බැරකම්වලට එළඹ තිබුණි.

**(ආ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 18 ක් සඳහා සළසා තිබුණු රු.356,875,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 36 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 සිට සියයට 96 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

2014 අප්‍රේල් 30 දින වන විට අමාත්‍යාංශය පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු. 510,361 ක් වී තිබුණි. ඉන් රු.260,361ක් වූ ශේෂය 2007 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 16001 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.337,470 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. එය පිළියෙල කර තිබුණේ 2013 ජනවාරි 17 දින දීය.

## 1.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි යන්ත්‍ර සූත්‍ර නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| බහුවිධ මාධ්‍ය යන්ත්‍ර | 01 | වර්ෂ 01 |
| ලැප්ටොප් | 02 | වර්ෂ 01 මාස 02 |
| වායු සමන යන්ත්‍ර | 07 | මාස 09 |

### (ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

අමාත්‍යාංශය විසින් වාහන 05 ක් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

| | වාහන විස්තරය | වත්කම් ලබාදී ඇති ආයතනය |
|---|---|---|
| (i) | ඉසුසු ඩබල් කැබ් රථය | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය |
| (ii) | ඉසුසු ඩබල් කැබ් රථය | - එම - |
| (iii) | ටොයොටා ඩබල් කැබ් රථය | - එම - |
| (iv) | ටොයොටා ඩබල් කැබ් රථය | බුද්ධ සාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය |
| (v) | ටොයොටා ඩබල් කැබ් රථය | ක්‍රීඩා අමාත්‍යාංශය |

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු වාහන 03 ක් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වාහන වර්ගය | වත්කම අයත්ව තිබුණු ආයතනය |
|---|---|---|
| (i) | පර්ජෝ කාර් රථය | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| (ii) | සුහාරු ජීප් රථය | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| (iii) | ජීප් රථය | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය |

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට වඩා අඩු කාලයකට අදාළ බැරකම්වල එකතුව රු. 1,144,325 ක් විය.

(ii) බැරකම් ලේඛනයේ රු.95,380 ක බැරකම් ඇතුළත් කර නොතිබුණි.

## 1.6 අනුකූල නොවීම්

**නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසි වල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104 | - | වාහන අනතුරක් සිදුවීමෙන් සතියක් ඇතුළත ප්‍රාරම්භක වාර්තාව ලබාදිය යුතු වුවත්, වාහනය අනතුරට ලක්වී මාස 03 කට පසුව එම වාර්තාව ලබා දී තිබුණු අතර අනතුර සිදු වී මාස 04 ක් ඉක්මවා තිබුණත්, අදාල අවසාන වාර්තාව නිකුත් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 237 | 280,909 | වාහන අළුත්වැඩියාවේදී සතුටුදායක ලෙස වැඩ නිමකර ඇති බවට කාර්මික නිලධාරියෙකුගේ සහතිකයක් ලබාගත යුතු වුවත්, එසේ ලබාගෙන නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 756 | - | අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා වාර්තා ලබාගෙන නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 756(4) හා 2004 අගෝස්තු 31 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | - | (i) අපහරණය කරනු ලබන වාහන අනිවාර්යයෙන් ලියාපදිංචි කළ දින සිට වසර 10 ක් ඉක්මවා තිබිය යුතු වුවත් වසර 08 ක් පැරණි වාහන 02 ක් අපහරණය කර තිබුණි.<br>(ii) ඉකුත් වර්ෂවල ධාවන තත්ත්වයේ නොතිබුණු හා අළුත්වැඩියා කටයුතු නොකෙරුණු වාහන පමණක් අපහරණයට නම්කළ යුතු වුවත්, අපහරණය කළ වාහන 05 න් 04 ක් ම 2012 වර්ෂයේ ධාවනය කළ හා අළුත්වැඩියා කටයුතු සිදුකළ වාහන විය. |

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2012 ඔක්තෝබර් 08 දිනැති අංක BD/A/A01BC දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛය | - | රු.30,000 ක් බැගින් මාසික ඉන්ධන දීමනා ලබාගන්නා එක් නිලධාරියෙකු සංචිත වාහන ද පරිහරණය කර තිබුණි. |
| (ii) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | අමාත්‍යාංශය සතු වාහන 33 ක රාජ්‍ය ලාංඡනය සහ අමාත්‍යාංශයේ නම සඳහන් කර නොතිබුණි. |

**(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

**--------------------------**

| | | |
|---|---|---|
| 2.14.1 මාර්ගෝපදේශය | - | මිහිකත දිනය සැමරීම සඳහා රු.565,500 ක ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණු අතර එම ප්‍රසම්පාදනයන් සඳහා මුද්‍රා තැබූ මිල කැඳවීම් ලබාගෙන නොතිබුණි. |

## 1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**--------------------------------------**

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් පිළිබඳ විගණන නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) දොම්පේ සනීපාරක්ෂක කසල රඳවන බිම් පිරවුම් ව්‍යාපෘතිය 2013 වර්ෂයේ අවසානයට අවසන්කර ප්‍රයෝජනයට ගැනීමට සැලසුම් කර තිබූ නමුත් ඉදිකිරීම් කටයුතු නිමකර තිබුණේ 2014 මැයි මාසයේදීය. කෙසේවුවද 2014 සැප්තැම්බර් වනවිටත් එය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දොම්පේ සනීපාරක්ෂක කසල රඳවන බිම් පිරවුම් ව්‍යාපෘතිය පරිශ්‍රයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමට රු. මිලියන 69.5 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර ඒ පිළිබඳ පරීක්ෂාවේදී රු. මිලියන 22.26 ක අධි ඇස්තමේන්තුවක් කර ඇතිබවත් කොන්ත්‍රාත්කරුට රු. මිලියන 8.15 ක් වැඩිපුර ගෙවා තිබූ බවත් නිරීක්ෂණය විය. මාර්ගය ඉදිකිරීම් කටයුතු නියමිත ප්‍රමිතියට සිදුකර නොමැති බව රසායනාගාර වාර්තා 05 ක් මඟින් පෙන්නුම්කර ඇතත් ඒවා නිවැරදි කරවා ගැනීම සම්බන්ධව ද අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) ජාතික රසායනික ද්‍රව්‍ය පැතිකඩ යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය 2013 වර්ෂයේ ජනවාරි මාසයේදී නිමකිරීමට නියමිතව තිබූ නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලසුම පිළියෙල කිරීම 2014 මාර්තු 10 දින වන විටත් නිමකර කර නොතිබුණි.

(ඈ) ආර්ථික සහයෝගිතා අරමුදලේ ණය පහසුකම් මත සන අප ද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (EDCF) කාර්යමණ්ඩලය 2012 වර්ෂයේදී බඳවාගෙන ව්‍යාපෘති ගිවිසුම 2013 ජුලි 23 අත්සන් කර තිබුණු නමුත් වසර 02 ක කාලයක් ගතවී තිබුණද යෝජිත බිම් පිරවුම් 04 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. කෙසේවුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා වූ ව්‍යාපෘතියේ සමුච්චිත වියදමින් සියයට 64 ක් වූ රු.11,028,095 ක පිරිවැය ව්‍යාපෘති කාර්යමණ්ඩලය වෙනුවෙන් දරා තිබුණද ව්‍යාපෘතිය

යටතේ යෝජිත බිම් පිරවුම් 04 හි ඉදිකිරීම් කටයුතු වසර 02 ක කාලයක් තිස්සේ ආරම්භ කර නොතිබුණි.

(ඉ) 2008 සිට 2010 දක්වා අවුරුදු 03 ක කාල පරිච්ඡේදය තුළ නිම කිරීම සඳහා යෝජිත වූ "පිළිසරු ව්‍යාපෘතිය" වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් රු. බිලියන 5.633 ක් වෙන්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ව්‍යාපෘතිය 2010 වර්ෂයේ නිමකිරීමට සැලසුම් කර තිබුණද 2014 අගෝස්තු අවසානය දක්වාම නිමකර නොතිබුණු අතර ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ රු.බිලියන 5.633 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වැයකර තිබුණේ රු.බිලියන 1.965 ක් හෙවත් සියයට 35ක් පමණි.

(ii) ව්‍යාපෘතිය යටතේ කුඩා පරිමාණ කොම්පෝස්ට් අංගන 103 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර එයින් 69 ක් පමණක් ඉදිකර තිබුණි. එම ඉදිකිරීම් වලින් අංගන 31 ක් ඉදිකිරීම සඳහා පළාත් පාලන ආයතන 31 කට රු. මිලියන 66.73 ක මුදලක් ලබාදී තිබුණද, ඉන් 13 ක ඉදිකිරීම් ආරම්භකර නොතිබුණු අතර අංගන 03 ක් අතහැර දමා තිබුණි. ඉදිකිරීම් නිමකරන ලද අංගන 69 න් 14 ක කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කර නොතිබූ අතර අනෙක් අංගන උපරිම ධාරිතාවෙන් පොහොර නිෂ්පාදනය කිරීමට අපොහොසත්වී වී තිබුණි.

(iii) ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට සැලසුම් කළ මහා පරිමාණ කොම්පෝස්ට් අංගන 14 ක් අතරින් 06 ක් ඉදිකර තිබුණු අතර එයින් රු.මිලියන 248.7 ක් වැයකර ඉදිකර තිබූ මහා පරිමාණ කොම්පෝස්ට් අංගන 03 ක් පසු විපරම් කටයුතු නොකිරීම සහ මෙහෙයුම් අකාර්යක්ෂමතාවයන් නිසා අසාර්ථක වී තිබුණි.

(iv) නොදිරන කසල කළමනාකරණය කිරීම සඳහා බිම් පිරවුම් ස්ථාන 10 ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණද එයින් එක් ස්ථානයක් හෝ පිහිටුවා නොතිබුණ, අතර වෙන්කර තිබුණු මුදලින් රු.මිලියන 163 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා තාවකාලික බිම් පිරවුම් වෙනුවෙන් වැයකර තිබුණි.

## 1.8 කාර්යසාධනය

---------------

2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අවස්ථා.

(i) පහත එක් එක් අංශ සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන, අදාල කාර්යයන් වෙනුවෙන් වැය නොකර සම්පූර්ණයෙන් ඉතිරිව තිබුණි.

| **අංශය** | **මුළු ප්‍රතිපාදනය** | **ක්‍රියාකාරකම් සංඛ්‍යාව** |
|---|---|---|
| | රු. | - |
| තිරසර සංවර්ධන අංශය | 3,739,125 | 19 |
| දේශගුණික විපර්යාස අංශය | 2,710,000 | 18 |
| වායු තත්ත්ව කළමනාකරණ අංශය | 14,006,000 | 31 |
| ජෛව විවිධත්ව අංශය | 17,767,650 | 43 |

**(ආ) ප්‍රතිපාදනවලින් සියයට 50 කට අඩුවෙන් උපයෝජනය කිරීම**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පහත අංශවල එක් එක් ක්‍රියාකාරකම සඳහා සළසා තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 50 කට වඩා ඉතිරි වී තිබුණි.

| අංශය | ක්‍රියාකාරකම් සංඛ්‍යාව | මුළු ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| තිරසර සංවර්ධන අංශය | 15 | 9,087,000 | 1,755,615 | 7,331,385 |
| තිරසර පරිසර අංශය | 05 | 6,000,000 | 1,744,000 | 4,256,000 |
| දේශගුණික විපර්යාස අංශය | 06 | 1,425,000 | 406,481 | 1,018,519 |
| වායු තත්ත්ව කළමනාකරණ අංශය | 07 | 1,045,000 | 319,697 | 725,303 |
| **එකතුව** | | **17,557,000** | **4,225,793** | **13,331,207** |

**(ඇ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

අමාත්‍යාංශය සිය අරමුණුවලට අදාල කාර්යයවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික සම්මේලනය සඳහා රු. 181,155 ක වියදමක් දරා තිබුණි.

(ii) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වනජීවි හා පරිසර විද්‍යා අධ්‍යයන අංශය මඟින් පවත්වන ලද රැස්වීමක් සඳහා රු. 1,000,000 ක වියදමක් දරා තිබුණි.

**(ඈ) ඕසෝන් වියන රැකගැනීම පිළිබඳව දැනුවත් කිරීම**

ඕසෝන් වියන රැකගැනීම පිළිබඳව දැනුවත් කිරීම ජාතික ඕසෝන් ඒකකයේ ප්‍රධාන අරමුණක් වුවත් දිප ව්‍යාප්තව වැඩමුළු පැවැත්වෙන ස්ථාන හා ඉලක්කගත කණ්ඩායම් හඳුනාගැනීම, ක්‍රියාකාරකම් තීරණය කිරීම හා සංග්‍රහ වියදම් හා පහසුකම් සැපයීම සම්බන්ධයෙන් පොදු සැලසුමක් පිළියෙල කර නොතිබුණු අතර අරපිරිමැසුම්දායි බවින් තොරව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රු. 100,000 සිට රු. 400,000 ක් දක්වා පරාසයක් තුළ වියදම් දරා තිබුණි.

**(ඉ) වෙනත් වැය විෂයයන් යටතේ සංචාර සඳහා වැය කිරීම**

අමාත්‍යවරයා හා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සිදුකළ සංචාරයක් වෙනුවෙන් අමාත්‍යවරයාට වෙන්කළ වැය විෂයයට බාහිරව රු. 82,000 ක් වැයකර තිබුණි.

## 1.9 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වු පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වාහනයක් අළුත්වැඩියා කිරීමේදී අඩු මිල ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු තෝරා නොගැනිම හේතුවෙන් රු.71,400 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අවස්ථා 08 ක දී සිදුවූ රු. 1,470,953 ක් වු අලාභ හානි අයකර ගැනීමට හෝ අලාභය පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.10 අනාර්ථික ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය නිර්මාණය කිරීම සඳහා මිල කැඳවීමට රු. 320,443 ක් වැය කොට පුවත්පත් දැන්වීම් පළකොට තිබූ නමුත් එම මිල ගණන් ප්‍රතික්ෂේප කොට සැලසිනේ

ආයතනයට එකී කාර්ය භාරදීමෙන් පුවත්පත් දැන්වීම් සඳහා දැරූ වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

## 1.11 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 55 | 24 | 31 |
| (ii) | තෘතියික මට්ටම | 38 | 35 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 183 | 127 | 56 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 76 | 57 | 19 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | 0 |
| | **එකතුව** | **353** | **244** | **109** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 109 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

### (ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

මධ්‍යම පරිසර අධිකාරිය විසින් වැටුප් ගෙවනු ලැබූ කම්කරුවන් දෙදෙනෙකු හා රියදුරෙකු අමාත්‍ය කාර්යාලයේ සේවය සඳහා යොදා ගෙන තිබූ අතර කම්කරුවන් දෙදෙනා වෙනුවෙන් මාස 07 ක් සඳහා රු. 284,030 ක් ද රියදුරු වෙනුවෙන් මාස 10 ක් සඳහා රු. 408,225 ක් ද අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

## 2. ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 13 දින වන සංරක්ෂක ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, මෙහි (අ) සිට ( ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 2.12 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| පොදු තැන්පතු ලැයිස්තුව | මුදල් රෙගුලාසි 571 (1) |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය | 2002 කොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

**(i)** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු නොවන වාහන 49 ක් භාවිතයට යොදාගත් කාලය පිළිබඳව තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඊට අමතරව එම වාහනවලින් වාහන 12 කට අදාල ලියාපදිංචි සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ii)** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගිනි අවි භාවිතය සම්බන්ධයෙන් 2013 ජනවාරි 01 දිනැති අංක ටීඑම්/අයි/වනස/වි.අ.තො./2013 දරන ලිපියෙන් තොරතුරු විමසූ අතර 2013 සැප්තැම්බර් 11 දින ඒ සම්බන්ධයෙන් සිහිකැඳවීමක් කළද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) අයවැය විචලනය**

වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 56 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) ආදායම් ගිණුම්**

**---------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** ඉදිරිපත් කළ ගිණුම් 02 කට අනුව එකතුව රු.711,472,671 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසයකට අදාල විය. එම හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**(ii)** ආදායම් සංකේතාංක 20:02:01:02 දරන රජයේ කැලෑවලින් ලැබෙන ආදායම් ගිණුම පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟ ආදායම රු.710,594,987 ක් වු අතර එම හිඟ ආදායමට රාජ්‍ය දැව සංස්ථාවෙන් ලැබිය යුතු ස්කන්ධභාග ලෙස රු.706,610,519 ක්ද, නුවරඑළිය දිසා වන කාර්යාලයෙන් රු.2,464,768 ක් හා පොළොන්නරුව කාර්යාලයෙන් රු.1,294,100 ක්ද ඇතුළත් වී තිබුණි.
- හිඟ ආදායම තුළ 2009 වර්ෂයට පෙර සිට පැවැත එමින් තිබුණු රු. 2,500 ක් හා 2011 වර්ෂයේ සිට පැවැත එන රු.50,000 ක්ද, ඇතුළත් වී තිබු අතර එම හිඟහිටි ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පොත්පත් අනුව රාජ්‍ය දැව සංස්ථාවෙන් ලැබිය යුතු ස්කන්ධභාග මුදල් සහ රාජ්‍ය දැව සංස්ථාවේ ගිණුම් අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ස්කන්ධභාග මුදල් අතර රු.45,047,889 ක වෙනසක් වූ අතර එය නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

**(iii)** ආදායම් සංකේතාංක 10:03:07:03 දරන පුද්ගලික දැව ප්‍රවාහනය ආදායම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.877,685 ක හිඟහිටි ආදායම් දක්වා තිබුණත්, පසුගිය වර්ෂයේ රු.1,137,051 ක හිඟහිටි ආදායම සමඟ සැසදීමේදී රු.260,166 කින් හෙවත් සියයට 22 කින් පමණ අඩුවී තිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 28301 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.7,993,003 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. එය පිළියෙල කර තිබුණේ 2013 මාර්තු 14 දින දීය.

### 2.4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඇති නමුත් එහි අභ්‍යන්තර විගණකවරයෙකු හා එක් විගණන නිලධාරියෙකු පමණක් සේවයේ නියුක්ත කර තිබුණි. 2009 ජූනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් අභ්‍යන්තර විගණන අංශය සඳහා යෙදවිය යුතු විය. එහෙත් ලංකාව පුරා කලාප, දිස්ත්‍රික් අඩවි වන කාර්යාල පිහිටුවා තිබුණු අතර වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 1,216 ක ප්‍රතිපාදන සළසා තිබුණි. අභ්‍යන්තර විගණනය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත නොකිරීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් ඵලදායි අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්කාර්ය ගිනි අවි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වාර්ෂික බලපත්‍ර ලබාගෙන තිබුණු ගිනි අවි නවයක් නිලධාරින්ට භාවිතය සඳහා නිකුත් නොකර නිෂ්කාර්යව ගබඩාවල තබාගෙන තිබුණි.

**(ii)** ලියාපදිංචි කර, මුරකරු බලපත්‍ර ලබා ගෙන තිබුණු ගිනි අවි සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී කලාප කාර්යාලවල හා දිසා වන කාර්යාලවල ගිනි අවි 124 ක් නිෂ්කාර්යව පැවැතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 15 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, ප්‍රධාන කාර්යාලය , උප කාර්යාල හා සංචාරක බංගලා 107 ක භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් රජයේ ආයතන 10 ක් සතු වාහන 49 ක් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ එකකට අඩු කාලයක සිට පැවත එන බේරුම් නොකළ බැරකම් ප්‍රමාණය රු. 1,681,446 ක් විය.

## 2.6 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 1951 අංක 17 දරන රථවාහන ආඥා පනතේ 99 වගන්තිය | - | වාහනයක් ධාවනය කිරීම සඳහා අවම වශයෙන් තෙවන පාර්ශවීය රක්ෂණයක් තිබිය යුතු බව අවධානය කර තිබුණු අතර, 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ් 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින්ද එම අවශ්‍යතාවය තහවුරු කර තිබුණි. |

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 128(1)(ඉ) | ගණනය කර නැත | රජය සතු වු හෝ රජයේ භාරයේ පවත්නා වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ රක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදනු ලබන බවට ගණන්දීමේ නිලධාරියා වගකිවයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 570 හා 571(1) | 24,336,316 | තැන්පත් කළ දින සිට වසර 2 ක් ඇතුළත හිමිකම නොපාන ලද තැන්පත් කල් ඉකුත් වූ තැන්පතු ලෙස සැලකිය යුතු අතර සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම තැන්පතු ලැයිස්තුවක් පිළියෙල කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි |
| (iii) | මුදල් රෙගුලාසි 104(1) | ගණනය කර නැත | දෙපාර්තමේන්තුවේ සිදු වී තිබුණු ඇතැම් අලාභහානි සම්බන්ධයෙන් අලාභහානිය ගණනය කර එහි වගකිව යුත්තන් නිශ්චය කර අදාළ බලධාරීන් වෙත වාර්තා කළ යුතු වුවත්, සිද්ධීන් 90 කට අදාල අලාභහානි සම්බන්ධයෙන් එසේ වගකිව යුත්තන් වෙත 2013 දෙසැම්බර් 31 දින වන විටත් වාර්තා කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 104(3) | ගණනය කර නැත. | නැතිවීම් හා පාඩුවීම් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරිමට දින 07 කට වැඩි කාලයක් ගත වේයැයි අදහස් කරන විට ප්‍රාරම්භක වාර්තාවක් යැවිය යුතු බව අංක 02/2007 දරන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයෙන්ද අවධාරණය කර තිබුණත්, නැතිවීම් හා පාඩුවීම් පිළිබඳ ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට දීර්ඝ කාලයක් ප්‍රමාද කර තිබුණි. |

**2.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

---

**බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

---

බැංකු ගිණුම් 01 කට අදාලව 2013 අගෝස්තු මාසයේ සිට බැංකු සැසඳුම් ප්‍රකාශන 2014 ජුලි 14 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**2.8 අවිධිමත් ගනුදෙනු**

---

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) පොලිතීන් මළු මිලදී ගැනීම**

---

දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික පොලිතින් මලු අවශ්‍යතාවයය නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ පොලිතීන්මලු අවශ්‍යතාවය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2,000,000 ක් වුවත්, 2013 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 99 ක් වැය කර පෞද්ගලික සමාගම් දෙකකින් පොලිතීන් මලු 8,716,000 ක් මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මිල ගණන් කැඳවීමෙන් පසු එක් පෞද්ගලික සමාගමකින් පොලිතින් මළු 3,921,000 ක් මිලදී ගැනීමෙන් අනතුරුව නැවත මිල ගණන් කැඳවීමකින් තොරව එම සමාගමෙන් තවත් පොලිතින් මළු 1,125,000 ක් මිලදි ගෙන තිබුණි.

(ii) අනෙක් පෞද්ගලික සමාගමෙන් පොලිතීන් මළු 3,670,000 ක් මිලදී ගෙන තිබුණු අතර, ඉන් මළු 670,000 ක් මිල ගණන් කැඳවීමෙන් තොරව මිලදි ගෙන තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩ ඇනවුම් කිරීමේදී ඒ සඳහා සාධාරණ හේතු දැක්වීමක් කර ඇති බවට ගණන්දීමේ නිලධාරියා පෞද්ගලිකවම සෑහීමකට පත්විය යුතු වුවත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ට පොලිතින් මලු අතිරේකව මිලදී ගැනීමේදී ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(iv) ඉහත මිලදී ගැනීම්වලදී සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණු අතර කාර්යසාධන බැඳුම්කරද ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ප්‍රධාන කාර්යාලයේ පැල හා ප්‍රකාශන අලෙවි මධ්‍යස්ථානය වටා වැටක් ඉදිකිරීම**

-------------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය පැල හා ප්‍රකාශන අලෙවි මධ්‍යස්ථානය වටා වැටක් ඉදිකිරීම හා ගේට්ටුවක් සවිකිරීමේ කටයුතු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු නොකර, රාජ්‍ය දැව සංස්ථාව ලවා ඉටුකරවා ගැනීම හා ඒ වෙනුවෙන් රු.733,612 ක් රාජ්‍ය දැව සංස්ථාවට ගෙවා තිබුණි.

(ii) මෙම ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරුට භාරදීමෙන් පසු රාජ්‍ය දැව සංස්ථාවට අවශ්‍ය ආකාරයට කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුව වෙනස් කර තිබුණත් ඒ පිළිබඳව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් විමසීමක් සිදු කර නොතිබුණු අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද ඒ පිළිබඳව රාජ්‍ය දැව සංස්ථාවෙන් හේතු විමසීමක් කර නොතිබුණි.

(iii) පළමු ඇස්තමේන්තුවේ ඇතුළත්ව තිබුණු කාර්යය අයිතම 05 ක් ඉවත් කර අතිරේක ඇස්තමේන්තුව පිළියෙල කළ බව සඳහන් කර තිබුණත්, එය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) රාජ්‍ය දැව සංස්ථාව ලවා රු.733,612 කට එම කොන්ත්‍රාත්තුව ඉටු කරවා ගැනිමට නිර්දේශ කර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනිමට කටයුතු කර තිබුණි. කොන්ත්‍රාත්තුව අවසන් කිරිමට දින 04 ක් තිබියදී 2013 මැයි 03 දින ප්‍රසම්පාදන කමිටුවෙන් ඉල්ලීම සිදු කර තිබුණත්, කමිටුව විසින් කොත්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු අවසන් කර කොන්ත්‍රාත්කරු වෙත අවසන් ගෙවීම කළ පසු එනම් 2013 මැයි 31 දින ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා දි තිබුණි.

(v) ඉහත වැට හා ගේට්ටුව ඉදිකරීමේ කාර්යය රාජ්‍ය දැව සංස්ථාව ලවා ඉටුකරවා ගැනීමට ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණේ 2013 මැයි 21 දින වන අතර ඒ වන විට එම ඉදිකිරීම් අවසන් වී කොන්ත්‍රාත්කරුට අවසන් ගෙවීමද සිදු කර තිබුණි.

(vi) කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් කිසිදු ලේඛන පරීක්ෂාවක් සිදු නොකර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක (සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති) ගේ 2013 මැයි 03 දිනැති අංක SF & E /04/ තවාන් , නප්‍ර.කා./08/2013 දරන ලිපිය පමණක් පදනම් කරගෙන ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාදී තිබුණි.

(vii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම සම්බන්ධයෙන් වන ප්‍රමාණ බිල්පත් පරික්ෂා කිරීමකින් තොරව ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හා රාජ්‍ය දැව සංස්ථාවේ ලිපියක් පදනම් කරගෙන 2013 ජුනි 28 වන දින රු.733,612 ක් රාජ්‍ය දැව සංස්ථාව වෙත ගෙවා තිබුණි.

## 2.9 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) වාහන හා අනෙකුත් පාඩු හා අලාභහානි

අලාභය රු. 25,000 ට අඩු සිද්ධීන් 34 ක්ද, අලාභය රු. 25,000 ට වැඩි සිද්ධීන් 56 ක්ද වශයෙන් සිද්ධීන් 90 ක් 2014 මාර්තු 31 දින වන විටත් නිරවුල් නොකර පැවති අතර ඉන් ඇතැම් සිද්ධීන් අලාභය සිදුවී වර්ෂ 10 කට වැඩි කාලයක් ගතවී තිබුණි. නමුත් එම පාඩු හා අලාභහානි නිරවුල් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

### (ආ) වාහන අනතුරු

වාහන අනතුරුවලට ලක්වී නිසා සිදුවු තිබුණු පාඩුවලින් 2011 හා 2012 වර්ෂවලදී පිළිවෙලින් රු. 162,474 හා රු.230,380 ක් කපා හැර තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දින වන විට කපාහැරීමට, අතහැරීමට හෝ අයකර ගැනීමට තීරණය කර නොතිබුණු වාහන අනතුරු සංඛ්‍යාව 76 ක් වී තිබුණි. වාහන අනතුරු 64 ක් සම්බන්ධයෙන් ගණනය කරන ලද අලාභයේ වටිනාකම රු.6,189,544 ක් වී තිබුණි.

## 2.10 විසඳා නොතිබුණු විගණන ඡේද

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද වලින් පසුවිපරම් කටයුතු නිම කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2008 | 4.3(ආ) | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු වල දුර්වලතාවය |
| 2009 | 4.3(ii) | |
| 2010 | 1.3(ඇ) (i) | |
| 2011 | 1.3(ඊ) | |
| 2012 | 1.3(ඉ) | |

| | | |
|---|---|---|
| 2010 | 1.21(ඊ) | වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබීම |
| 2011 | 1.11(ක) | |

## 2.11 කළමනාකරණ දූර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

### (අ) දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරින්ගේ ඇඳුම් භාවිතය

ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ප්‍රතිනිර්මාණය කරන ලද නිල ඇඳුම් වෙනුවෙන් 2011 හා 2012 වර්ෂවල පිළිවෙලින් රු.13,137,541 ක් හා රු.7,152,926 ක් වැය කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එම නිල ඇඳුම් භාවිතා කර නොතිබුණි. ඒ පිළිබඳව නිලධාරීන්ගේ අවධානය යොමු නොකර 2013 වර්ෂය සඳහා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නිල ඇඳුම් සඳහා රු.13,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර, ඉන් රු.10,318,221 ක් වැය කර තිබුණි.

### (ආ) වන ව්‍යාප්ති නිලධාරින් සඳහා නිල ඇඳුම් ලබා නොදීම

ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා නිල ඇඳුමක් නිර්මාණය කර තිබුණත්, වන ව්‍යාප්ති ක්ෂේත්‍රයෙහි ප්‍රධාන කාර්යභාරයක් හා වන සංරක්ෂණ කටයුතු මහජනයා අතරට ගෙනයාමේදී විශාල කාර්යභාරයක් ඉටුකරන වන ව්‍යාප්ති නිලධාරීන්ට නිල ඇඳුමක් නිර්මාණය කිරිම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

### (ඇ) හදිසි ඇමැතුම් සේවයට (දුරකථන අංක 1991 ට) ලැබෙන වන අපරාධ පැමිණිලි සම්බන්ධයෙන්වූ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

හදිසි ඇමැතුම් සේවය මගින් වන අපරාධ සම්බන්ධයෙන් ලැබී තිබුණු පැමිණිලි සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(i)** අමාත්‍යාංශයේ හදිසි ඇමතුම් සේවය වෙත ලැබී තිබුණු වන අපරාධ පැමිණිලිවලින් වැඩි ප්‍රමාණයක් රක්ෂිත ගස් කැපීම් , අනවසර ලී ඉරීම්, කළුගල් කැඩීම යනාදිය විය. එම පැමිණිලි වන සංරක්ෂකවරයාටත් ඉන්පසු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක (ආරක්ෂිත හා නීති ක්‍රියාත්මක කිරීම) හදිසි වැටලීම් ඒකකයටත් අනතුරුව දිසා වන කාර්යාලය වෙතත් යැවීම සඳහා අවම වශයෙන් දින දහයකට වඩා වැඩි කාල පමාවක් සිදු වී තිබුණි.

**(ii)** 2013 අගෝස්තු 30 දින දක්වා දිසා වන කාර්යාල වෙත යොමු කරන ලද පැමිණිලි 79 කින් පැමිණිලි 30 ක් පිළිබඳව පරීක්ෂා කර බලා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. ඒ අතරින් ලැබී තිබුණු ඇතැම් පැමිණිලි දිසා වන කාර්යාල වෙත ඉදිරිපත් කර මාස 8 කටත් වැඩි කාලය ක් ගත වී තිබුණි.

**(iii)** වන අපරාධ සම්බන්ධයෙන් ලැබී තිබුණු සමහර පැමිණිලි අදාළ කාර්යාලවලට දුරකථනයෙන් දැණුම් දුන් බව සටහන් කර තිබුණද, එම පැමිණිලි පරීක්ෂා කර වාර්තා කිරිමට දීරඝ කාලයක් ගත කර තිබුණි.

**(iv)** පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ හදිසි වැටලීම් ඒකකය වෙත ලැබෙන වන අපරාධ පැමිණිලි සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව කඩිනමින් පරීක්ෂණයක් සිදු කළ යුතු වුවත්, එම පැමිණිලි අදාල දිසා වන කාර්යාලයට යොමු කිරීම හා ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ දීර්ඝ ප්‍රමාදයක් සිදු කර තිබුණි. මේ නිසා වන අපරාධ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට ඇති ඉඩකඩ ඇහිරී තිබුණි. ඒ අනුව 2013 අගෝස්තු මාසය වන විට ලැබි තිබුණු පැමිණිලි 79 කින් එක් වන අපරාධයක් පමණක් අනාවරණය කර ගෙන තිබුණි.

**(v)** පහත දැක්වෙන පරිදි පසුගිය වර්ෂ 04 ක කාලය තුළ හදිසි ඇමතුම් ඒකකයට ලැබී තිබෙන පැමිණිලි සංඛ්‍යාව සීඝ්‍ර ලෙස අඩු වී තිබුණි. ඒ අනුව හදිසි ඇමැතුම් ඒකකය කෙරෙහි මහජනයා තුළ පවතින විශ්වාසය අඩු වී තිබුණි.

| වර්ෂය | ලැබී තිබුණු පැමිණිලි ගණන |
|---|---|
| 2010 | 224 |
| 2011 | 220 |
| 2012 | 178 |
| 2013 අගෝස්තු දක්වා | 79 |

**(ඇ)** **ගිනි අවි භාවිතය හා වාර්තා තබාගැනීම**

මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(i) පතොරම් පිළිබඳ ත්‍රෛයිමාසික වාර්තා**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- දෙපාර්තමේන්තුව සතු ගිනි අවි පරිහරණය පිළිබඳව වන සංරක්ෂක ජනරාල් විසින් 2000 ජුනි 08 දිනැති අංක 07/2000 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 16 ඡේදය ප්‍රකාරව එක් එක් නිලධාරියා විසින් පාවිච්චි කරන ලද පතුරොම් පිළිබඳව විස්තර වාර්තාවක් ත්‍රෛයිමාසිකව දිසා වන නිලධාරීන් විසින් නියමිත ආකෘතිපත්‍ර ප්‍රකාරව පිළියෙල කර කාර්තුවකට පසු එළඹෙන මාසයේ 15 දිනට පෙර ආරක්ෂක හා නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ නියෝජ්‍ය වන සංරක්ෂක වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද 2013 දෙසැම්බර් 11 දින වන විටත් පොළොන්නරුව, මහනුවර , කුරුණෑගල, නුවරඑළිය හා මාතර දිසා වන නිලධාරීන් මුල් කාර්තු 2 සඳහා පමණක් එම වාර්තා එවා තිබුණි. ඒ අනුව දිසා වන නිලධාරීන් 19 ක් විසින් එම චක්‍රලේඛ විධිවිධාන ඉටුකිරීම පැහැර හැර තිබුණි.
- එවන ලද වාර්තාවලින් කුරුණෑගල දිසා වන නිලධාරීන් එවූ වාර්තා නියමිත ආකෘතිය ප්‍රකාරව නොවූ අතර ජීව උණ්ඩ භාවිතා කළ දිනයන්, ස්ථානය, හේතූන්, වන අපරාධ අංකය යනාදිය සටහන් කර නොතිබුණි.
- මහනුවර දිසා වන නිලධාරී භාරයේ ඇති ගිනි අවි 04 ක ජීව උණ්ඩ භාවිතය පිළිබඳ විස්තර ත්‍රෛයිමාසික වාර්තාවට ඇතුළත් කර නොතිබුණි.

**(ii) වලංගු මුරකරු බලපත්‍ර ලබාගැනීම**

වලංගු මුරකරු බලපත්‍ර ලබා ගැනීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- 2000 ජුනි 08 දිනැති අංක 07/2000 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ පළමු ඡේදය ප්‍රකාරව වන සංරක්ෂක ජනරාල්වරයා විසින් වර්ෂයකට වලංගු වන පරිදි නිකුත් කරන ලද වලංගු මුරකරු බලපත්‍රයක් නොමැතිව කිසිම නිලධාරියෙකු සේවා ගිනි අවියක් භාවිතා නොකළ යුතු වුවත්, දිසා වන කාර්යාල දෙකක නිලධාරීන් තිදෙනෙකු මුරකරු බලපත්‍ර ලබා නොගෙන ගිනි අවි භාවිතා කර තිබුණි.
- වව්නියාව දිසා වන කාර්යාල සඳහා 2013 මැයි 10 දින නිකුත් කරන ලද බෝර 12 වෑන්ගාඩ් වර්ගයේ ගිනි අවි 04 සඳහා 2013 වර්ෂය සඳහා වලංගු මුරකරු බලපත්‍ර ලබාගෙන නොතිබුණි.
- 2000 ජුනි 08 දිනැති අංක 07/2000 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂයේ මුරකරු බලපත්‍ර ලබාගැනීම සඳහා පවත්නා වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර වන සංරක්ෂක ජනරාල්වරයා වෙත යැවීමට හැකි වන

පරිදි දෙසැම්බර් 01 දිනට හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කළ යුතු වුවත් , නිසි වේලාවට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මුරකරු බලපත්‍ර නිකුත් කිරීමට අදාල වර්ෂයේ මාස පහක් ඉක්මු අවස්ථාවන් නිරීක්ෂණය විය.

- බෝර 12 ගිනි අවියක් 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී පාවිච්චියට ගත නොහැකි බව සඳහන් කර තිබුණද, ඒ සඳහා 2013 වර්ෂය සඳහා මුරකරු බලපත්‍රයක් නිකුත් කර තිබුණි.

**(iii) ගිනි අවි ලියාපදිංචිය**

-----------------------

දෙපාර්තමේන්තුවේ ගිනි අවි ලියාපදිංචි කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- බෝර 12 පතොරම් ගිනි අවි 08 ක් 1997 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ලියාපදිංචි කර නොතිබුණු අතර 2013 වර්ෂයේදී රු.54,400 ක් ගෙවා එම ගිනි අවි ලියාපදිංචි කර තිබුණි. ඉන් රු.27,200 ක් ලියාපදිංචිය ප්‍රමාදවීම නිසා අයකල දඩමුදල් වී තිබුණි.

- භාවිතයෙන් ඉවත් කළ ගිනි අවි 30 ක් ප්‍රධාන ගබඩාවට භාරදී තිබුණත්, 2014 වර්ෂය දක්වා භාවිතයට නොගත් කාලය වෙනුවෙන් එම ගිනි අවි සඳහා ලියාපදිංචි ගාස්තු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ගෙවා තිබුණි.

**(iv) අබලන් ගිනිඅවි අපහරණය**

----------------------------

ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් ප්‍රකාරව අබලන් හා භාවිතයට නොගන්නා ගිනි අවි පොලීසියට හෝ ප්‍රාදේශීය ලේකම්වරුන්ට භාරදිය යුතු වුවද, 2013 දෙසැම්බර් 26 දින වන විට ප්‍රධාන ගබඩාවේ අබලන් ගිනි අවි 30 ක් පැවැතුණි. ඇතැම් ගිනි අවි වර්ෂ පහක් පමණ කාලයක පටන් ගබඩාවේ තැන්පත් කර තිබුණත් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(v) ගිනි අවි පුහුණුව**

-------------------

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ගිනි අවි පුහුණුව ලබා දිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- 2013 ජුලි 20 හා 21 යන දෙදින තුළ කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී වන ක්ෂේත්‍ර සහකාර නිලධාරීන් සඳහා ගිනි අවි පුහුණු වැඩසටහනක් පවත්වා තිබුණි. මෙම පුහුණුව සඳහා නිලධාරීන් 40 ක් වෙනුවෙන් රු. 119,920 ක් කළුතර පොලිස්

අභ්‍යාස විද්‍යාලයට ගෙවා තිබුණි. නමුත් පුහුණුව සඳහා නිලධාරීන් 36 ක් පමණක් සහභාගිවි තිබුණි.

- 2013 වර්ෂයේදී ගිනිඅවි පුහුණු වැඩසටහන් 5 ක් දිසා වන නිලධාරීන් සහ අඩවි වන නිලධාරීන් වෙනුවෙන් පවත්වා තිබුණු අතර පුහුණුවීමට යෝජිත සංඛ්‍යාවෙන් හත් දෙනෙකු සහභාගිවී නොතිබුණි. එක් එක් දිසා වන නිලධාරියෙක්/ අඩවි වන නිලධාරියෙක් වෙනුවෙන් පිළිවෙලින් රු.3,683 ක හා රු.2,650 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණත්, මෙම ගිනි අවි පුහුණුවීම සඳහා නිලධාරීන් සහභාගී නොවීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.

- ගිනි අවි පුහුණුව සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී සියළු නිලධාරීන්ට පුහුණුව ලැබෙනසේ හා පුහුණුව අත්‍යවශ්‍ය නිලධාරීන්ට ප්‍රමුඛත්වය ලැබෙනසේ කලාප කාර්යාලවලින් හෝ අඩවි වන කාර්යාලවලින් තොරතුරු ලබාගෙන තිබු බවට සාක්ෂි නිරීක්ෂණය නොවූ අතර මෑතකදී පුහුණුව ලැබූ නිලධාරීන්ට නැවත පුහුණුවීම සඳහා යොමු කිරීම තුළින් මෙම පුහුණුවීම් මනාලෙස සැලැසුම් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඉ)** **වාහන**

-------

දෙපාර්තමේන්තුවට අයත් වාහන 219 න් නිලධාරීන් සඳහා වෙන්කළ වාහන 04 ක් හැර අනෙකුත් කිසිදු වාහනයක් සඳහා රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. වාහන අනතුරු ඉතාම බහුල මෙවැනි කාලයක රක්ෂණ ආවරණයක් නොමැතිව රථවාහන ධාවනය කර වාහන අනතුරුවලට ලක්වීමෙන් තෙවන පාර්ශවයන්ට වන හානිය හා එහි ගමන් ගන්නා රියදුරු ඇතුළු නිලධාරීන්ගේ ජීවිතවලට වන හානිය පිළිබඳව නොසළකා හැර කටයුතු කර තිබුණි.

**(ඊ)** **කළුගල් කැඩීම හා බොරළු ඉවත් කිරීම**

**--------------------------------------**

ත්‍රිකුණාමලය දිසා වන කාර්යාලය, අඩවි වන කාර්යාලය සහ කන්තලේ අඩවි වන කාර්යාල විසින් කලුගල් කැඩීම හා බොරළු ඉවත් කිරීම පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(i) බොරළු ඉවත් කිරීම**

------------------------

ත්‍රිකුණාමලය හා කන්තලේ අඩවි වන කාර්යාල විසින් බොරළු ඉවත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- නගර හා කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉලුප්පයිකුලම් නැමති වන රක්ෂිතයෙහි බොරළු ඉවත් කිරීම සඳහා බලපත්‍ර ලබාදී තිබුණු බොරළු ඉල්ලම්කරුවන් 09 දෙනෙකු විසින් බොරළු ඉවත් කර තිබුණත්, ගිවිසුම් ප්‍රකාරව අදාල සමාන පුනරුත්ථාපනය කර නොතිබුණි. එම ඉල්ලුම්කරුවන් විසින් දිසා වන කාර්යාලයේ තැන්පතු වශයෙන් රඳවා ගෙන තිබුණු මුදල් යොදවා හෝ එකී සමාන යථා තත්ත්වයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම බොරළු ඉවත් කර තිබුණු ස්ථානවල සමාන වලවල් පැවැති අතර වැසි කාලයේදී එම ස්ථානවල වතුර රැදී තිබුණි. එය පරිසරයට හා සමාජයට අහිතකර ලෙස බලපෑමක් කර තිබුණි.
- බොරළු ඉවත් කිරීම උදෙසා ස්ථානයක් ලබාදීමේදී එකිනෙකාට යාබදව සමානයන් ලබාදීම තුළින් එක් එක් අයට බොරළු ඉවත් කිරීම සඳහා ලබාදුන් සමානයන් වෙනම හදුනා ගැනීමට නොහැකි වී තිබුණි.
- බොරළු කපා ගැනීම හා ප්‍රවාහනය සඳහා අවසර ලබාදීමේදී නිකුත් කරනු ලබන "C" ආකෘතිපත්‍ර පිටපත් ගොනුකර තිබූ බවට සාක්ෂි නොතිබුණි. එබැවින් නිකුත් කරනු ලබන සමහර "C" ආකෘති පත්‍රයක පිටපතක් අදාල ගොනුවලට ඇතුළත් වී නොතිබුණු අවස්ථා විය.
- බොරළු කැපීම සඳහා පාරිසරික නිර්දේශ ලබාදීමේදී මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පනවා ඇති නොක්දේසි අනුව අවසාන කැපීම්තලය සෘජු නොවිය යුතු අතර සිරස් හා තිරස් බෑවුම් 1:1 වනසේ ආනත විය යුතු වුවද, බොරළු කපන ලද බොහෝ ස්ථානයන්හි අවසාන කැපුම් සෘජුව තිබූ අවස්ථා දක්නට ලැබුණි.
- 2012 වර්ෂයේදී කන්තලේ අඩවියේ සේරුවිල බීට්ටුවේ සේරුවිල රජයේ කැලයෙන් බොරළු කියුබ් 1400 ක් කපා ඉවත් කර ගැනීමට පුද්ගලයෙකු අවසර ඉල්ලා තිබුණි. ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේදී මෙයට පෙර බොරළු කියුබ් 250 ක් කපා ඉවත් කර ගැනීමට ලබාදී තිබූ අවසරය පරිදි බොරළු ඉවත් කිරීමේදී ගිවිසුම්වලට එළඹ තිබුණි. එම ගිවිසුම්වලට පටහැනිව අඩි 6 ක් පමණ ගැඹුරු වලවල් පිහිටනසේ බොරළු ඉවත් කර තිබුණි. එසේම ගුරුවලහේන ප්‍රදේශයෙන් බොරළු කියුබ් 1000 ක් කපා ඉවත් කර ගැනීමට නිර්දේශය පමණක් තිබියදී නීති අවසරය රහිතව බොරළු කියුබ් 200-220 ත්

අතර ප්‍රමාණයක් ඉවත් කර තිබුණු අතර බොරළු ඉවත් කරන ලද ස්ථානයන්හි වලවල් වසා දමා නිසි පරිදි පොලව සකස් කර නොතිබුණි. එවකට ත්‍රිකුණාමලය සහකාර දිසා වන නිලධාරී විසින් දිසා වන නිලධාරී වෙත මේ බව දැනුම් දී තිබුණු අතර, දිසා වන නිලධාරී විසින් කන්තලේ බීට්ටු වන නිලධාරී සහ අඩවි වන නිලධාරීගෙන් 2012 ජුනි 19 දින නිදහසට කරුණු විමසා තිබුණි. දිසා වන නිලධාරී විසින් නැවත 2012 අගෝස්තු 30 දිනද ඒ පිළිබඳව සිහිකැඳවීමක් යවා තිබුණද, විගණන දිනය වූ 2013 සැප්තැම්බර් 05 දින වන විටත් ඔවුන් විසින් නිදහසට කරුණු ඉදිරිපත් කර නොතිබුණි. මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 කොටසෙහි රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධව පළමුවන උපලේඛනයේ 14 වගන්තිය යටතේ සඳහන් වරදක් ලෙස නිරීක්ෂණය විය.

(ii) **කළුගල් කැඩීම**

-------------------

කන්තලේ හා ත්‍රිකුණාමලය අඩවි වන කාර්යාල විසින් කළුගල් කැඩීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කන්තලේ අඩවියට අයත් වෙන්ඩ්‍රාසන් පුර කන්තලේ රක්ෂිතයේ පිහිටි කලුගලෙන් ගල් කඩා ගැනීම සඳහා ආයතන හා පුද්ගලයින් 17 දෙනෙකුහට වරින්වර අවසර ලබාදී තිබුණි. එකී ගල්වලවල් භෞතික පරීක්ෂාවේදී ගල්වලවල් තුනක පමණක් වැඩ කරමින් පැවතුණි. එම ගල් වලවල් තුනෙහි දිනපතා සේවය කරන අය පිළිබඳ විස්තර, දිනපතා ගල්වලවල් වලින් නිකුත් කරන ගල් ප්‍රමාණය, ලැබුණු වෙඩි බෙහෙත් පිළිබඳ විස්තර ඇතුළත් වාර්තා පවත්වා නොතිබුණි. මේ නිසා නිකුත් කර තිබුණු අවසර පත්‍රය අනුව නියමිත ප්‍රමාණයට පමණක් කළුගල් ඉවත් කර තිබුණේද යන්න පිළිබඳව තහවුරු කර ගැනිමට නොහැකි විය.

- පොළොන්නරුව අඩවි වන කාර්යාලයට අයත් රක්ෂිතයක් වන කන්‍යා කිලිකුංජිමලේ පිහිටි කළුගලකින් වරින්වර කළුගල් කියුබ් 350 ක් කඩා ගැනීමට අවසර ලබා දී තිබුණි. ඒ අනුව කළුගල් කියුබ් 350 ක් සඳහා කියුබ් එකකට රු.1,000 ක් බැගින් රු.350,000 ක් රජයයට ගෙවා තිබුණි. අවසරපත්‍රලාභියා විසින් කළුගල් කියුබ් 1205 ක් කඩා ඉවත් කර ගෙන තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව කළුගල් කියුබ් 855 ක් වෙනුවෙන් රජයට අයවිය යුතු රු.855,000 ක් අහිමි වී තිබුණි.

**2.12 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 44 | 41 |
| (ii) | තෘතීක මට්ටම | 42 | 30 | 12 |
| (iii) | ද්විතීයක මට්ටම | 1,383 | 977 | 406 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,609 | 1,218 | 391 |
| | **එකතුව** | **3,119** | **2,269** | **850** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 850 ක් පිරවීම් ආයතනය අපොහොසත් වී තිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) | බීට්ටු වන නිලධාරී | 01 | පරිසර අමාත්‍යශය | 2008 වර්ෂයේ සිට 2014 අප්‍රේල් 30 දින දක්වා |
| (ii) | වන ක්ෂේත්‍ර සහකාර | 04 | පරිසර අමාත්‍යශය | - එම - |